


# මගේ අරමුණ සියලු දෙනාටම විශ්වාසවන්ත සේවාවක් පහසු මුදලකට සැපයීමයි

## ට්‍රෙවිස් ඩි සිල්වා
## ගුඩ් ගයිස් - වැඩ්ස්ටන්

ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිකයෝ මෙරටේ විවිධ ක්ෂෙත්‍ර වල ඉහළ ස්ථාන කර ගමන් කරමින් සිටිනු අපට දැකගන්නට හැකි වෙයි. එය අපේ සිත් වලට ඉතා ආඩම්බ-රයක් මුසු සතුටක් ගෙන දෙන්නකි. නොවැම්බර් 16 වන දා ශ්‍රී ලාංකියකු වන ට්‍රෙවිස් ඩි සිල්වා මහතා කීර්තිමත් වෙළඳ ව්‍යාපාරික ජාලයක් වන ගුඩ් ගයිස් ආයතනයේ නවතම ශාඛාව වැඩ්ස්ටන් හිදී ආරම්භ කළ පුවත ද අපට ගෙන දුන්නේ එවන් වූ විශාල සතුටකි. මෙවර අපි දිරිය දෑත් තුළින් ට්‍රෙවිස් ඩි සිල්වා හමුවෙමු.

**මේ ව්‍යාපාරය ආරම්භ කරන්නට මූලිකව හේතුවුණ කාරණා මොනවද කියල අපි මුලින්ම කතා කරමු**

මම මුලින්ම වැඩ කළේ ලංකාවේ හේලීස් සමාගමේ. මම එහි පිලිප්ස් විදිලි භාණ්ඩ අංශයේ අධ්‍යක්ෂ මෙහෙයුම් ලෙස සේවය කළා. ඒ පළපුරුද්ද මට හුඟක් ප්‍රයෝජනවත් වුණා. මට මාකටිං පිළිබඳව



## දුර ඈත

**ශ්‍රීනාත් මද්දුමගේ**

එංගලන්තයේ සහ ලංකාවේ උපාධිධාරියකු වීමත් මට විශාල ශක්තියක් වුණා. 1991 දී මම ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණා. ඊට පස්සේ බ්‍රැෂස් සමාගමේ සේල්ස්මන් කෙනෙකු හැටියට අවුරුදු දෙකක් වැඩ කළා. ඊට පස්සෙ මට එහිම කළමණාකරු ලෙස උසස්වීමක් ලැබුණා. ඉන්පස-ෟසෙ මම පයනියර් ආයතනයේ වෙළඳ කළමණාකරු ලෙස පත්වීමක් ලැබුවා. මම ගුඩ් ගයිස් ආයතනයට සම්බන්ධවුණේ ඉන් අනතුරුවයි. ගුඩ් ගයිස් ආයතනයේ කුඩා ශාඛාවක් මම මොඩියලැක් ප්‍රදේශයේ ආරම්භ කළා. ඒක සාර්ථකව කරගෙන යන විට ෆ්‍රැන්ක්ස්ටන් සහ මුරබින් ආයතන දෙකක් ආරම්භ කළ නිසා මොඩියලැක් ශාඛාව වහන්න වුණා. ඉන් පසුව නිව් සවුත් වේල්ස් වල කැම්බර්ත් නගරයේ ශාඛාවක් ආරම්භ කරන ලෙස මට උපදෙස් ලැබුණා. මම ඒ ශාඛාව ආරම්භ කළා. අවුරුදු 4 ක් පමණ ඒ හාඛාව කරගෙන යන විට තමයි ගුඩ් ගයිස් ආයතනයෙන් මට යෝජනා කළේ වැඩ්ස්ටන් හි ශාඛාවක් ආරම්භ කරන ලෙස. ඒ අනුව තමයි වර්ග අඩි 3000 ක් පමණ තියෙන මේ විශාල ශාඛාව ආරම්භ කළේ. මුලුතැන් ගෙයි සිට විසිත්ත කාමරය දක්වා නිවසට අවශ්‍ය සියලුම දේ මෙතැනින් ලබා ගන්න පුලුවන්.

**මෙම ශාඛාවෙනුි ශ්‍රී ලාංකිකයන්ට ලැබෙන විශේෂත්වයක් තිබෙනවද?**

මම හැමවිටම උත්සාහ කරන්නෙ ශ්‍රී ලාංකිකයන්ට හොඳ තත්වයේ බඩු අලෙවි කර හොඳ වට්ටම් ලබා දීමටයි. ඒ ගැන පරීක්ෂා කරන්නට එක වරක් මේ ශාඛාවට ගොඩ වෙලා බලන්නැයි මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මේ වන විට ශ්‍රී ලාංකිකයන් විශාල සංඛ්‍යාවක් මේ ශාඛාවට ගොඩ වෙලා තියෙනවා. මම ඔවුන්ට ඇදහිය නොහැකි තරමේ වට්ටම් ලබා දීලා තියෙනවා. ඒ එක්කම මම අලුත් වැඩ සටහනක් සකස් කරනවා අලුතෙන් ඕස්ට්‍රේලියාවට පදිංචි වන අයට අවශ්‍ය සියලුම දේ පහසු ක්‍රමයකට පැකේජ් එකක් ලෙස ලබා දෙන්න.

ඒ එක්කම මෙහි සේවකයන් 55 ක් පමණ සේවය කරනවා. එයින් ශ්‍රී ලාංකිකයනුත් 10 දෙනකු පමණ මම සේවයට යොදවාගෙන ඉන්නවා. එය අපේ අයට තවත් පහසුවක් වෙයි. අනාගතයේ මම බලාපො-රොත්තු වෙනවා තවත් වැඩි



ගණනක් ශ්‍රී ලාංකිකයන් මගේ වැඩ වලට සහභාගි කරවාගන්න.

**ඔබේ පවුලේ විස්තර කතා කළොත්**

අද මගේ විශේෂ දවසක්. අද මගේ 31 වන විවාහ සංවත්සර දවස. මගේ සියලු සාර්ථකත්වය පිටුපස ඉන්නෙ මගේ බිරිඳයි. ඇය ෂෙරිල් ඩි සිල්වා. මට දරුවන් 4 දෙනෙක් ඉන්නවා. එක දියණියක් සහ පුතුන් තිදෙනෙක්. ඔවුන් වෙළඳ ක්ෂෙත්‍රයට සම්බන්ධ නැති විවිධ ක්ෂෙත්‍ර වල රැකියා වල නිරතව ඉන්නවා. මට එක මුණුමුරෙකුත් ඉන්නවා.

**ඔබේ අත්දැකීම් අනුව යම්කිසි භාණ්ඩයක් මිලට ගන්නා විට පාරිභෝගිකයන් සැළකිලිමත් විය යුතු විශේෂ කාරණා මොනවාද?**

ම කියන්නෙ භාණ්ඩයක් ගන්නකොට මිල ගැන සැළකිලිමත් වෙනවා වගේම අඩු ගානට තියෙන භාණ්ඩයකට වඩා ව්‍යාපාර නාමයක් තියෙන භාණ්ඩයක් ගැනීම පාරිභෝගිකයාට වාසියි. එහෙම වෙන්නෙ ඒ භාණ්ඩ හුඟක් කාලයක් පාවිච්චි කරන්න පුලුවන් නිසාත් ඒවාට වගකීමක් තියෙන නිසාත්. හිමතිස්සෙම වොරන්ටි එකක් තියෙන භාණ්ඩයක් ගන්න එක සුදුසුයි. ඒ එක්කම භාණ්ඩ සඳහා විශේෂ වොරන්ටි පීරියඩ් එකක් ගැනීමත් වැදගත් වෙනවා. මුලදී භාණ්ඩය ගන්නා විට වැඩි මිලක් යනවා වගේ පෙනුනත් දීර්ඝකාලීනව එයින් ලාබයක් වෙනවා. ඒ එක්කම මම විශේෂයෙන් කියන්න ඕනෙ මේ සමයේ ඔබ මිලට ගන්නා විදුලි උපකරණ සඳහා පවර් ගාඩ් එකක් දමා ගන්නා ලෙස. එයට හේතුව තමයි මේ කාලයේ බොහෝ අය වාසුසමන යන්ත්‍ර පාවිච්චි කරන නිසා විදුලිය නිතරම අඩු වැඩි වීම. හැම භාණ්ඩයකටම නෙවෙයි. වටිනා භාණ්ඩ වලට පවර් ගාඩ් එකක් යොදා ගැනීම වැදගත්. මොකද ඔබ රක්ෂණයක් අරගෙන තිබුණත් විදුලිය වෙනස් වීමෙන් සිදුවන හානි පිළිබඳව කටයුතු කරන විට නොයෙකුත් ප්‍රශ්න මතු වෙනවා.



අපි කියමු කවුරු හරි වෙනත් ආයතනයකින් අඩු මිලට මේ භාණ්ඩ ලබා ගන්නට හැකි බව අපට දන්-වනවා කියා. අපි සූදානම් ඒ ගාණට වඩා අඩු මිලට ඒ භාණ්ඩය ලබා දෙන්න. එසේ කරන්නේ අපට යම් කිසි ලාබයකි තියෙනවා අප එයිනුත් පාරිභෝගිකයාට පහසුවක් සළසන්නයි. ඒ එක්කම අපේ අලුත් සේවාවක් තියෙනවා පැන්ට්‍රි කබඩ් සහ මුලුතැන් ගෙයි ලී බඩු සපයන. මේවා අපෙන් ගන්නවා නම් අපත් සමග එකතු වෙලා ඉන්නවා ඕස්ට්‍රේලියාවේ ප්‍රසිද්ධ ව්‍යාපාරික ආයතනයක්. ඔවුන් ඩොලර් 1000 ක භාණ්ඩ වවුචරයක් ලබා දෙනවා.

විවිධ ක්ෂෙත්‍ර වල නියුතුව සිටිනා අපේම ඇත්තෝ මේ ඔස්ට්‍රේලියානු සමාජයේ ඉදිරියටම යමින් සිටිති. ඔවුන් අපේ මව් බිමඩ ආඩම්බරයකි. අපේ සමාජයට ශක්තියකි. අපේ සහයෝගය ඔවුනට ලැබිය යුතු ය.



# ගම් ගස, නුග ගස සහ අපේ දුරුමය

මෙල්බර්න් නගරාසන්න උපනගරයක ඉඩමක් මිලදී ගත් මිතුරකුට හරිම අකරතැබ්බයකට මුහුණ දීමට සිදුවිය. ඉඩමේ මායිමකට ආසන්නයෙන් පිහිටි විශාල ගම් ගස විශාල කරදරයක් විය. ගස කපා දමා නිවස ඉදිකිරීමට අදහස් කලද ඒ සඳහා අවසර නොලැබුනි. එපමණක් නොව අධික ලෙස ගල් සහිත ඉඩම සකස් කිරීමට ගෙන ආ යන්ත්‍ර සූත්‍ර වලින් මේ ගස ආරක්ෂා කිරීමට ආරක්ෂක වැටක්ද මිතුරාගේ වියදමින් ඉදිකිරීමටද සිදුවිය. මෙල්බර්න් අවට ඇති උපනගරවල සියළුම ඉදිකිරීම් වලදී ගම් ගසට ලැබෙන සැලකිල්ල ඔබ සැම දන්නා කරුණකි.

මෙරට ආදිවාසීන් වත් මෙතරම් සැලකිල්ලක් තිබේද යන්න ගැටළුවකි. ඕස්ට්‍රේලියාවට වඩා සිය ගුණයකින් පමණ පුංචි අපේ මව්රටේ වැදගත් පැරණි ගස්වලට අපි සලකන්නේ කෙසේද යන්න සොයා බැලීම මාගේ මෙම කෙටි ලිපියේ එක් අරමුණකි.

බෞද්ධයන්ගේ මුදුන්මල්කඩ වන ජය ශ්‍රී මහා බෝධියට ඉතාමත් ගෞරවණීය සැලකිල්ලක් ලැබී ඇත. තවද සෑම පංසලකම ඇති බෝධිවලටද නොමද සැලකිල්ල තිබුනත්, බෝධියට ආසන්නයේ තෙල් පහන් දැල්වීම නිසා අනතුරුදායක තත්වයක්ද පවතී. කාලයක් අපේ රටේ මහා මාගී දෙපස සෙවනට තිබූ මාරගස් කපා දමා කාන්තාර දේශගුණයකට අවර්තීන වී සිටිමු. මෙම මාර ගස් ප්‍රමාණයෙන් විශාල නිසා නිවාසවලට, විදුලි රැහැන්වලට අවහිරයක් නිසා කපා දැමූ බව ආසන්නට ලැබුනත් එම ගස් තිබූ තැනට ප්‍රමාණයෙන් විශාල නොවූ ගස් වැවීමට උනන්දු වූවා නම් ඉතාම අගනා සේවයක් වනු ඇතිබව මගේ අදහසයි.

අවුරුදු සියගණනක් පැරණි දෙනිපිටියේ නුග රුක ආසන්නයේ සංවර්ධන සහා ගොඩනැගිල්ලක් ඉදිකර, එයට අවහිරයක් වන නිසා නුග ගස කපා දැමූ බවක් මාධ්‍යවලින් වාර්තා කර තිබුනි. ඉහත සඳහන් කල ගම් ගස කෙතරම් වාසනාවන්තද ?

සංස්කෘතික ත්‍රිකෝණය වැඩ පිලිවෙල යටතේ පොලොන්නරුවේ වටදාගෙය මත වතුර ටැංකි ඉදිවිය. තිවංක පිලිම ගෙයට වහලක් සාදා එහි චිත්‍ර විනාශ වීමට සැලැස්විය. අවුකන පිලිමයට ඩොල් වහලයක් ඉදිකර පිලිමය අනතුරු දායක තත්වයකට පත් කලේය.

සිංහල ජාතිය, තමන්ගේ අතීත ශ්‍රී විභූතියට වඩා විදේශවලින් පැමිණි පහත්පෙලේ වින්දනයක් කෙරෙහි යොමුවීම මේ විනාශයන් ට මුල බව මගේ අදහසයි. ගමේ තියෙන පලතුරු වලට වඩා ඇපල් ගෙඩියට, ඕස්ට්‍රේලියාවෙන් එන දොඩම් ගෙඩියට මහත් ඇල්මක් දක්වයි. සුද්දෝ ඉඹලා පිලිගත යුතු බවට කලක් අපේ නායකයින් නිතරම දොඩමළු වූහ. කොටි සංවිධානය හරහා සුද්දන්ගේ වැඩ අපි හොඳටම දන්නා නමුත්, තවමත් අඳ බාල පිරිසික් පිටරටවලට ආවඩමින් ජාතිය පාවා-දෙති.

ලංකාව ලංකාවක් කිරීමට මිසක සිංගප්පූරුවක් කිරීමට නොහැක. එසේ කිරීමට යාම හරියට කියනවනම් සීගිරිය මුදුනේ සංචාරක හෝටලයක් ඉදිකිරීම වැනිය. මේ යන ක්‍රමයට නම් සීගිරි පර්වතය මුදුනක හෝටල් ඉදිකිරීම පමණක් නොව දඹුලු ගලක්, ගල් මොල් අයිතිකාර දේශපාලකයෙකු අතට පත් වීම වැඩි ඈතක නොවනු ඇත.

වසර තිහක් රටම දුකට පත් කරමින් විනාශයක් කල ත්‍රස්තවාදය නිම කර වසරක් ගිය තැන රටේ යුද්ධයක් තිබුනාද කියා අමතක කර ඇති ජාතියකට සීගිරි චිත්‍ර විනාශවීම, හෝ දෙනිපිටියේ නුගරුක විනාශ කිරීම ගැන කවර සිහිනයක්ද ?

පී. විජේසුන්දර
ක්රෙගිබර්න්